


# පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

## මාතුවාගේ කතා

"කිරි අප්පොච්චියේ ! උඹත් මෙහෙ ද? " පන්හිඳට කියවුණා.

"මාතුවා නේද මේ?" උඹ කවද්ද මෙහෙට පාත් වුණේ?"

පින්සලටත් පුදුමයි මාතුපාල මේ දෙන්නගෙ ම ගමේ ඉස්කෝලේ පන්ති මිත්‍රයෙක්.

"අපි ඇවිත් දැන් බොහොම කල්. උඹලා දන්නෙ නැතිවට!"
ඉතින් එහෙනං කතාවත් නො කළේ ?"පින් ඇහුවා.

"මුණ ගැහිලම දෙකක් කතා කරන්නයි හිතං උන්නෙ"
මාතුපාල කිව්වෙ ටිකක් හරහට වගේ.

"උඹේ කටනං වෙස්වෙලා නෑ වගේ" පන් කිව්වා.

"හොඳ වෙලාවට එහෙනං ප්‍රසංගය මුලදි මුණ නොගැහුනෙ" පින් කිව්වෙ මාතුපාලගෙ කට අවුසාගන්න හිතාගෙන.

මේ අය මේ මුණ ගැහුණෙ බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසැලේ දරු දැරියෝ ඉදිරිපත් කරපු වාර්ෂික විවිධ ප්‍රසංගය බලලා එන අතරෙදි.

"නැගපං තො අපේ වාහනේට ටිකක් කතා කරමු. මාතුපාල පන්ගෙයි පින්ගෙයි ආරාධනාව පිළිගත්තා.

"දෙකක් කතාකරන්නයි කියල කිව්වෙ?" පන් වාහනයේ වීදුරු එහෙම වහලා දෙකක් අහගන්න සූදානම් වුණා.

"මං, මේ බලපං ! මිනිස්සු කරන්නඕන තමන්ට හරියන අදාල දෙයක්. දැන් උඹල දෙන්නම බලපල්ලා පන්හිඳයට අපි ඔය නම කිව්වෙ අර වීදිය බණ්ඩාර සර් ළමයින්ගෙ නම් ලැයිස්තු ලියවාගන්න උඹව අල්ලගත්ත හින්දනේ. මේ පින්සලයා කේඩෑරිවට උන්නට ලොකුවට වැවුන කොණ්ඩයක් තිබුණා. හරියට කෙදි උඩට වෙන්න කෙලින් හිටවපු පින්සලක් වගේ. උඹලා දෙන්නා ඒ නම් වලට පින්සිද්ද වෙන්න මෙහාට වෙලා මේ මොනවද කරන්නෙ? ලූලා නැති වලට කනයා පණ්ඩිතයාය කිව්වලුනේ..."

"අපිත් ඉතිං මචං කාන්සිය යන්නත් එක්ක විනෝදෙට වාගෙ ඔය පොඩි පොඩි දේවල් කරනවා තමයි. ඒ වුණාට ලොකුවට හිතලා වැඩකරන්න ගියේ නෑ මාතුවෝ" පින් බයාදු වුණා.

"අර කවියක්, තේරවිල්ලක් කියාන උන්නු උඹ දැන් ලියන්නෙ මොනවද? නැටං ගැන. උඹ දන්න නැටුමක් තියෙනවද? හරියට පදයකට අඩියක් තියාගන්න පුළුවන් එකෙක් නං කමක් නෑ. මෙහෙ දරුවන්ට සිංහල උගන්නන හැටි ගැන ලියන්න උඹ අඩු ගානේ මේ වාගේ සිංහල භාෂා ඉස්කෝලෙකට, දහම් පාසැලකට පය ගහලා තියෙනවාද? පවුල් ප්‍රශ්ණ ගැන ලියන්න උඹට පවුලක් පංසලක් ඉන්නවද? ආදරය ගැන පැණි බේරෙන්න ලියන්නෙ උඹ කෙල්ලෙක්ගෙ අතින් අල්ලල තියෙනවද? සින්දු හදපු ඈයොවත් හිතුවෙ නැති දේවල් උඹේ ලියං වල තියෙන්නෙ... " මාතුපාල කියාගෙන කියාගෙන ගියා.

"මේ පින්සලයා... අර ඉස්කෝලේ පන්තියක් ගානෙ ඩෙස් එකක් ගානේ බල ඇඳ ඇඳ උන්නු මිනිහා. දැන් නොකරන්නෙ ඒක විතරයි !"

"උඹ මේ කියන්නෙ හදන්නෙ මොකක්ද? කියපං බලන්න අපි මොනවද කරන්න ඕන කියලා?"

"වැඩකට ඇති දෙයක් කරපං ! ඕවා ලිව්වා කියලා උඹලට වගතුවක් වෙන්නෙත් නෑ. මෙහෙ ඈයින්ට වැඩක් ඇත්තෙත් නෑ..''

"ඒ කිව්වෙ?"

"මේ බලපං ! අද මෙතන තිබුණ උත්සවය ගැන හිතපං ! කිසිම තරඟයක් නෑ. තම තමන්ට පුළුවන් උපරිමයෙන් දරුවන්ට අපේ යමක් උගන්නලා වේදිකාවට එව්වා. කවුරුවත් ඉස්මතු වෙන්න, උඩ පනින්න හැදුවෙත් නෑ."

" ත ර ඟ ය ක ු ත "

තියෙනවන්නේ හැමෝම හොඳ ම දේ කරන්නෙ උනන්දු වෙන්නෙ ඒ හන්දා ඒකේ වැරැද්දක් නෑනේ. පින් මාතුපාලගේ කතාවට හරස් වුණා.

"ඒක ඇත්ත. එහෙමනං ඒක හරියට කරන්න ඕන. අනික මේ ඉංගිරිසි පරිසරයේ හැදෙන අපේ පොඩි උන්ට සිංහලෙන් වැඩ කරන්න ගියාම තියෙන ලොකුම අමාරුව තමයි සිංහල හරියට උච්චාරනය කරන්න බැරිකම. දෙවම්පියන්ට විතරක් නෙවි, මේ දේවල් මේ විදියට පුරුදු කරවන ගුරුවරුන්ටත් තියෙන ලොකුම අභියෝගය ඒකයි. ලංකාවේ හැදෙන වැඩෙන අයටනං ඒ පරිසරය තියෙනවා. සම්පත් ඕනතරං ෂල්ලි තියේනං ඉහටත් උඩින්. ඕ දේකට යොමුකරවන්න පුළුවන්. මෙහේ හැදෙන පැටව් ගැන ඒ විදියට හිතන්න බෑ"

"ළමයින්ට විතරක් නෙවෙයි ලොකු අයගැන වුනත් ඒ ගැන කියන්න තියෙන්නෙ ඔය ටික තමයි. "පින් එකඟ වුණා. එහෙදි යමක් කරලා මෙහෙට ඇවිත් ඉල්ල අයට තියෙන ලොකුම බාධකය තමයි මෙහේ සිංහල දෙයක් කරන්න ඕන කරන සම්පත් හිඟකම. ඒ පරිසරය නැතිකම"

"අනික අවංකවම ගත්තොත් උඹලා ලියන්නෙ, අඳින්නෙ කලාව ගැන විතරයි වාගෙ. ඇත්තටම මේ ලෝකේ පවතින්නෙ කලාව හන්දා විතරක් මද? මේ මනුස්ස වර්ගයාට සේවයක් කරන ඈයො අනික් ක්ෂේත්‍රවල නැද්ද. ඒ ඈයො කරපු දෙයක් ඇත්තෙම නැද්ද? ඒ ගැන ලියන්න හිතෙන්නෙ නැද්ද? අඳින්නෙ නැද්ද? මාතුපාල වාහනයෙන් බහින්න දොර ඇරියේ පින්ටයි පින්ටයි කොචෝක් හිනාවකුත් දාගෙන.

"ඇත්ත තමයි මාතුවාගේ කතාව" පින්ට කියවුණා.

"මොනවා වුණත් අද මෙතන තිබුණ ප්‍රසංගය ගැන යමක් ලියන්න ඕන. ඊට පස්සෙ බැරියැ මාතුවා කියපු දේවල් ගැන කල්පනා කරලා බලන්න. පින් කිව්වා.



මෙරට ඉපැදුණ. හැදෙන වැඩෙන අපේ මතු සිංහල කවි පදයක් කීවත්, අපගේ හුරුවට අතක් පයක් නැටවුවත් එය අපගේ සොම්නසට ම හේතු වෙයි. එනයින් බලන කල අපගේ සංස්කෘතිකාංගයන්ගෙන් ගහණව වේදිකා ගතවූ බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසැලේ වාර්ෂික විවිධ ප්‍රසංගය අපහට සොඳුරු අත්දැකීමක් වීය. ශ්‍රී ලාංකේය බතික් කලාවෙන් අලංකෘත ඔසරියෙන් සැරසීගත් නව යෞවන දියණියන් "ආයුබෝවන්" යැයි දෑත් එක්කොට කළ සමාචාරය සමාරම්භය සඳහා වූ නැවුම් ප්‍රවිශ්ඨයක් වීය. විදුහල වෙනුවෙන්ම නිර්මිත පාසැල් ගීතයයි. පොල්තෙල් පහණ දැල්වීමෙන් අනතුරුව ගැයුනේ වේදිකා පසුතල සීගිරි බිතු සිතුවමින් සිත්තම් වී තිබිණ.

තම තමන්ගේ ප්‍රසාංගික අංගය තමන් විසින් ම හඳුන්වා දෙමින් වේදිකා ප්‍රාප්ත වීමට සලස්වා තිබීම අළුත් අදහසකි අප හටනම්. තමන්ගේ අංගය හඳුන්වා දෙන දරුවන් වෙනුවෙන් වේදිකාව ඉදිරිපිට ඊට වඩා පහත් මට්ටමින් ඉදිකර තිබුණ පීඨිකාව උපයෝ-ගී කරගැනින.

ඒ ඒ අංග සඳහා උචිත වන සේ තමන්ගෙ ශක්තියෙන් නිර්මාණයකරගත් ඇඳුම් ද ආකර්ශනීය වීය. නොයෙකුත් වයස් පරතරයන්ට අනුව, ඒ ඒ පන්තිවල මට්ටමට අනුව ඉදිරිපත් වූ අංගයන් සඳහා ඊට ගැලපෙන අන්දමේ කථාංග සම්පාදනය කළ ගුරුභවතුන්ට අපගෙ ප්‍රශංසාව හිමිවේ. පාසැල් ගීයෙන් පසුව එකිනෙකට වෙනස්ව ඉදිරිපත් වූ එවන් අංග විසිපහක් පමණ වීය. පූජා නැටුම, ගොවි නැටුම, ආදී සිසුවියන්ගේ නර්ථනය වැනි සාම්ප්‍රදායික නර්ථනයන් මෙන්ම "කං කං බූරු" , දඟකාරයි හැඩකාරයි" වැනි සුරතල් ළමා නර්ථනයෙන් ද, විශාරද අමරදේවයන්ගෙ "රත්න දීප ජන්ම භූමි" මහාචාර්ය සනත් නන්දසිරි ශිල්පියානන්ගේ "ගමේ කෝපි කඩේ" වැනි ගීතයන්ට ඉදිරිපත් කළ අංගයන්ද සිත්ගන්නා සුළු වීය. රෝහණ බැද්දගේ ශිල්පියාණන්ගේ ගීයක් අනුව රංගගත "ගල් බෝරේ" අංගයද විරිඳු ගායනාවන්ද ඇගයීමට ලක්විය යුතුයි.

ප්‍රසංගයේ කථාංග තුලින් වරින් වර අසන්නට ලැබුණා වූ ජන ගී රටාවන්, ජනගී නාද රටා අසුරින් ලයනල් රන්වලයන් නිර්මාණය කළ ජන ගී තනු වූ අතර, රංගනයන්ට අවශ්‍ය පරිදි ඒවාට වචන එක්කර තිබීම විශේෂයක් විය. කෙසේ වුවද ජන ගී නාද රටා අපගේ රසිකයින්ගේ සවනට හුරු කරවීමෙහිලා රන්වලයන් ගත් උත්සාහය මල්පල ගැන්වී ඇති බව දකින්නට අසන්නට ලැබීම සතුටට කහේතුවකි.

ප්‍රසංගය පුරාවටම විවිධ ගායනා නර්ථන හා රංගන ආචාර්යවරුන්ගෙන් ඔපමට්ටම් වූ දරු දැරියන්ගේ ඉදිරිපත් කිරීම් කැපී පෙනුණ බව නොකිව මනාය. එකිනෙකා පරයන තරඟවල නොවාද අවංකවම තමන් දත් දෑ මේ පරිසරයේ හුදෙකාලව කකලා පිවාසිත වූ දරුවන්ට බෙදා දෙන්නේ නම්, මව් බිමේ දරුවන් ඉදිරියේ සංක්‍රමණක දරුවන් සැහැල්ලුවට පත්වනවා වෙනුවට ආරාධිත ඔවුන්තිත් අප දරුවන් තිළිණ ලබන දිනය දුරක නොවේ.

**නිවාස සහ ඉඩකඩම් නවීකරණය කරගැනීමට**

**ඔබ සිතනවාද?**

**SETSQUARE PROPERTY**
DEVELOPMENT

ARCHITECTURAL DESIGNS FOR

- Subdivisions (Make use of your Large Backyard)
- New Homes/Units Development Plans
- Extensions and Renovations

COVERS ALL SUBURBS
For Obligation Free Consultations

Contact - Asanka Jayawardena
**Mob : 0402 443 554 Tp : 9323 7393**
asankapj@gmail.com